රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

2020.02.09 දින

අධ්‍යක්ෂ ප්‍රවෘත්ති,
ප්‍රවෘත්ති කර්තෘ,

## ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ඉන්දීය නිල සංචාරය

ඉන්දීය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මහතාගේ ආරාධනයකට අනුව අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා නිල සංචාරයක් සඳහා 2020.02.07 දින ඉන්දියාව බලා පිටත්ව ගියේය. මෙය මහින්ද රාජපක්ෂ මහතා අග්‍රාමාත්‍ය ධූරය ලබා ගත් පසු සිදුකරන පළමු විදේශ සංචාරය වේ. ඉන්දියාවට ළඟා වූ ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යතුමන්ව එරට මානව හිමිකම් සංවර්ධන, සන්නිවේදන, විද්‍යුත් හා තොරතුරු තාක්ෂණ රාජ්‍ය අමාත්‍ය දෝර් සංජය ෂර්මා සහ නවදිල්ලියේ ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලයීය කාර්ය මණ්ඩලය විසින් උණුසුම් අයුරින් පිළිගනු ලැබීය.

පස් දින නිල සංචාරයක නිරතව සිටින ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා (08) නවදිල්ලි නුවර දී හමුදා උත්තමාචාර මධ්‍යයේ චාරිත්‍රානුකූලව උණුසුම් ලෙස පිළිගනු ලැබූ අතර අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මහතා හා අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා අතර නිල හමුව ඉතාමත් සාර්ථක ලෙස සිදු කෙරුණි. එහිදී සුවිශේෂී මාතෘකා රැසක් සාකච්ඡා කළ අතර තීරණ රැසකට එළැඹීමට දෙරට අග්‍රාමාත්‍යවරුන්ට හැකි වී තිබේ.සාකච්ඡාවල ප්‍රධාන අවධානය යොමු වූයේ පසුගිය නොවැම්බර් මස ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ඉන්දියාවේ සිදුකළ සාර්ථක රාජ්‍ය සංචාරය අතරතුරදී ඉන්දීය අග්‍රාමාත්‍ය මෝදි මහතා සමඟ පවත්වන්නට යෙදුණු සාකච්ඡාවල ප්‍රතිඵල සම්බන්ධයෙනි.ඉන්දීය රජය අනුගමනය කරන "අසල්වැසියාට පළමු තැන" යන ප්‍රතිපත්තියට අනුව ශ්‍රී ලංකාව හා පවත්වන සම්බන්ධතාවන්ට ලබා දී ඇති ප්‍රමුඛතාව පිළිබඳව අග්‍රාමාත්‍ය මෝදි මහතාට ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යවරයා කෘතඥතාව පිරිනමා ඇත.

දෙරට අතර ඇති සහයෝගිතාවය බහුවිධ අංශ කෙරෙහි යොමු විය යුතු බවට ශ්‍රී ලංකාව විශ්වාස දරමින් රාජ්‍ය ආරක්ෂාව, ආර්ථික සංස්කෘතික සහ සමාජයීය යන අංශ ඇතුළු තවත් අංශ ගණනාවක් කෙරෙහි එහිදී අවධානය යොමු කොට ඇත. දෙරටේ රාජ්‍ය ආරක්ෂාවට අදාළව පවත්නා සහයෝගීතාවය, බුද්ධි අංශවල හැකියාවන් වැඩිදියුණු කිරීමටත්, ත්‍රස්තවාදය පිටු දැකීමටත් ඉන්දියාවෙන් ලැබුණු නිරන්තර සහයෝගය අඛණ්ඩව ලැබෙනු ඇතැයි ඉතා ඕනෑකමින් අපේක්ෂා කරන බවත් රාජපක්ෂ මැතිතුමා පවසා ඇති අතර පසුගිය අප්‍රියෙල් මස ලැබූ අත්දැකීම් වලට අනුව ජාතික ආරක්ෂක මූලෝපායන් පිළිබඳව නැවත වරක් සිතා බැලීමට සිදු වූ අතර ඒ සම්බන්ධයෙන් ඉන්දියාව ශ්‍රී ලංකාව වෙත දක්වන සහාය අග්‍රාමාත්‍යවරයා ඉතා අගය කොට සළකා තිබේ.

163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலப்பனை எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු. දු. / தொ t (+94 11) 2515759
ෆැ. / பெ f (+94 11) 2514753
ඊ. / மி e infodept@slt.lk
www.news.lk

පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරයෙන් ඉතා කෙටි කළක් ඇතුළත අග්‍රාමාත්‍ය මෝදි මහතා ශ්‍රී ලංකාවේ කළ සංචාරය පිළිබඳව ප්‍රසංසා කරමින් ඉතා අභාග්‍ය සම්පන්න අවස්ථාවකට මුහුණ දී සිටි ශ්‍රී ලංකාවට එයින් අත්මිදී යළි යථා තත්ත්වයට පත්වීමට ඉන්දීය අග්‍රාමාත්‍යවරයාගේ එම සංචාරය මහත් අස්වැසිල්ලක් වූ බවද අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා ප්‍රකාශ කර තිබේ. එසේම අග්‍රාමාත්‍ය මෝදි මහතා ශ්‍රී ලාංකීය ආර්ථිකය ගොඩනැගීම වෙනුවෙන් ශ්‍රී ලංකාව වෙත ලබා දුන් ඩොලර් මිලියන 400ක ණය ආධාරයත් ත්‍රස්තවාදය පිටු දැකීම වෙනුවෙන් ලබා දුන් ඩොලර් මිලියන 50 ණය ආධාරයත් අග්‍රාමාත්‍යවරයාගේ අගය කිරීමට ලක් විය.

නොවැම්බර් මස ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා සිදුකළ සංචාරය අතරතුරදී ගත් මෙම ප්‍රයත්නයන් සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු සිදුකිරීම ගැනත් තවදුරටත් සාකච්ඡා කර තිබේ. නිවාස ඉදිකිරීම් සහ ප්‍රජා පහසුකම් සැපයීමට අදාළව ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘති ඇතුළුව ඉන්දියානු අනුග්‍රහය යටතේ ශ්‍රී ලංකාව තුළ සිදුකෙරෙමින් පවතින ව්‍යාපෘතිවල ප්‍රගතිය සම්බන්ධයෙන් සාකච්ඡා කර තිබේ. දිවයිනම ආවරණය වන අයුරින් අදාළ නිවාස ව්‍යාපෘතිය පුළුල් කිරීමට තවදුරටත් සහයෝගය ලබා දීමට කටයුතු කරන මෙන් අග්‍රාමාත්‍යවරයා ඉන්දීය අග්‍රාමාත්‍යවරයාගෙන් ඉල්ලා තිබේ. එමඟින් රටේ ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන ශ්‍රී ලාංකිකයින් වෙත වැඩි ප්‍රතිලාභ ලබා දීමට හැකිවන බව අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා පෙන්වා දී තිබේ. ආර්ථික වශයෙන් දෙරටටම වැදගත් වන කාරණාවල දී ඉන්දියාව සහ ශ්‍රී ලංකාව සාමූහිකව කටයුතු කරන්නේ කෙසේ ද යන්න පිළිබඳව ද නායකයින් දෙපළගේ අවධානය යොමු කර තිබේ. ලෝකයේ වර්ධනය වෙමින් පවතින ආර්ථිකයක් සහිතව සීඝ්‍රයෙන් ඉදිරියට පැමිණෙන ඉන්දීය ආර්ථිකය, වඩා ස්ථාවරව පවත්වාගෙන යන ඇතැම් ආර්ථිකමය අංශ තුළින් ශ්‍රී ලංකාව වැනි රටකට ලබා ගත හැකි ප්‍රතිලාභ පිළිබඳව ද මහින්ද රාජපක්ෂ ආග්‍රාමාත්‍යවරයා අග්‍රාමාත්‍ය මෝදි මහතා සමඟ සාකච්ඡා කර තිබේ. එමෙන්ම ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවය තුළ නිපුණතා සහ හැකියාවන් සංවර්ධනය යන අංශයන් හි ඉන්දීය සහයෝගය සහ අනුග්‍රහය ලබා දීමට කටයුතු කරන මෙන් ඉන්දීය අග්‍රාමාත්‍යවරයාගෙන් ඉල්ලා තිබේ.

නුදුරු දිනකදී ම යළිත් ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වන මෙන් අග්‍රාමාත්‍ය මෝදි මහතා වෙත කළ ආරාධනය යළිත් සිහිපත් කරමින් ශ්‍රී ලාංකික ජනතාව ඉන්දීය අග්‍රාමාත්‍යවරයාගේ පැමිණීම ඉතා ගෞරවයෙන් අපේක්ෂා කරන බව ද මතක් කරන ලදී.

ශ්‍රී ලංකාවේ ආසන්නම අසල්වැසියා මෙන්ම දීර්ඝ කාලීන මිතුරා ද වන ඉන්දියාවේ සංචාරය කිරීමට ලැබීම ගැන ඉමහත් සතුටට පත් වන බව සඳහන් කරන අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා වසර දෙදහසකටත් අධික අතීතයක් දක්වා විහිදෙමින් දෙරට අතර පවතින ඓතිහාසික, ආගමික සහ සංස්කෘතික සබඳතා හවුල්කාරීත්වයට ශක්තිමත් පදනමක් සපයන බව ද පවසා ඇත. අවසාන වශයෙන් තමන් ඇතුළු නියෝජිත පිරිස වෙත මෙම රාජ්‍ය සංචාරය මුළුල්ලේ ලබා දුන් අනර්ඝ ආගන්තුක සත්කාරය සහ අනෙකුත් සියලුම පහසුකම් වෙනුවෙන් අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මහතා ප්‍රමුඛ ඉන්දීය රජය වෙත අග්‍රාමාත්‍යවරයා හදපිරි ස්තූතිය පිරිනමා තිබේ. ඉන්දීය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මහතා හා මා අතර ද්වි පාර්ශ්වීය සාකච්ඡා නවදිල්ලි නුවර දී පැවැත්විණි.

අනතුරුව අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා, ඉන්දීය ජනාධිපති රාම්නාත් කෝවින්ද් මහතා සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡා (2020.02.08) පස්වරුවේ නව දිල්ලියේ රාෂ්ට්‍රපතිභවන් හිදී පැවැත්විණි. මෙහිදී ශ්‍රී ලංකාවත් ඉන්දියාවත් අතර පවත්නා ද්විපාර්ශ්වීය සබඳතා තවදුරටත් ශක්තිමත් කර ගැනීම පිළිබඳව අවධානය යොමු කෙරුණු අතර දේශපාලන, සංවර්ධන, ආරක්ෂක, වෙළෙඳ, සංස්කෘතික ක්ෂේත්‍රවල දෙරට අතර පවතින සබඳතා වැඩිදියුණු කර ගැනීම පිළිබඳව ද දීර්ඝව සාකච්ඡා කරන ලදි. වෘත්තීය පුහුණු සහ රාජ්‍ය සේවා ඇතුළු ක්ෂේත්‍රවල පුහුණු අවස්ථා ඇති කිරීමට ඉන්දීය රජයේ සහාය පිළිබඳව ද මෙම සාකච්ඡාවේදී වැඩිදුරටත් අවධානය යොමු කෙරිණි.

අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා සහ ඉන්දීය විදේශ කටයුතු අමාත්‍ය සුබ්‍රමනියම් ජයශංකර් මහතා අතර හමුවක් අද (2020.02.08) නවදිල්ලියේදී පැවැත්විණි. ඉන්දීය අනුග්‍රහය ඇතිව ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘතිවල වත්මන් තත්ත්වය සම්බන්ධවයෙන් ද මෙම හමුවේදී සාකච්ඡා කළහ. පසුගිය වසර කිහිපය තුළ කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් නොකළ එවැනි ව්‍යාපෘති කිහිපයක වැඩ කටයුතු කඩිනම් කිරීමට දෙපාර්ශ්වයේ එකඟතාවය පළවිය. ශ්‍රී ලංකාවේ ආරම්භ කළ නිවාස ව්‍යාපෘතිය පිළිබඳව අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා අමාත්‍යවරයා වෙත කරුණු පැහැදිලි කළ අතර මීට පෙර නිවාස ව්‍යාපෘති සඳහා අරමුදල් සැපයූ ආකාරයෙන්ම නව ව්‍යාපෘතිය සඳහා ඉන්දීය අනුග්‍රහය ලබා ගැනීම පිළිබඳව ද අවධානය යොමු කිරීමට ශ්‍රී ලංකා ධූත පිරිස එහිදී කටයුතු කළහ. දෙරටේ ධීවර ප්‍රජාව අතර නිරන්තරයෙන් පවතින ගැටලුකාරී තත්ත්වය පිළිබඳව ද දෙපාර්ශ්වයේ නියෝජිත පිරිස මෙහිදී අවධානය යොමු කළහ. එමගින් අත්වන අනර්ථකාරී ප්‍රතිඵල පිළිබඳව සළකා බලා පීඩාවට පත්ව ඇති දෙරටේම ධීවර ජනතාවට සුභවාදී වන ප්‍රායෝගික විසඳුමක් ලබා ගැනීම සඳහා දෙපාර්ශ්වය ඉතා සමීපව කටයුතු කිරීමට ද එකඟතාවය පළ විය.ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය ඇතුළු ක්ෂේත්‍ර කිහිපයක් පිළිබඳව ඉන්දියාව තුළ විශාල උනන්දුවක් පවතින බව පැවසූ අමාත්‍යවරයා, ශ්‍රී ලංකාව සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය පියවර ගැනීම කෙරෙහිද මෙහිදී අවධානය යොමු විය.

සමස්තයක් ලෙස ගත් කළ ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින්ගෙන් වැඩිම පිරිසක් පැමිණෙන්නේ ඉන්දියාවෙන් වන අතර 2018 දී එම සංඛ්‍යාව 424887කි. නමුත් 2019 දී එල්ල වූ පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරය නිසා මෙම සංචාරක පැමිණීම පහත වැටිණි. පාස්කු ප්‍රහාරය එල්ල වී නොබෝ දිනකින් ඉන්දීය අග්‍රාමාත්‍ය මෝදී මහතා ශ්‍රී ලංකාවේ සංචාරයක නිරතවීම හරහා බලාපොරොත්තු වූයේ ශ්‍රී ලංකාව සංචාරය කිරීමට තරම් සුරක්ෂිත රටක් බව ඉන්දියාවට මෙන්ම සමස්ත ලෝකයටම ප්‍රකාශ කිරීම බව ඉන්දීය විදේශ අමාත්‍යවරයා සඳහන් කර සිටියේය. පාස්කු ප්‍රහාරයෙන් අනතුරුව ශ්‍රී ලංකාවේ සංචාරය කළ ප්‍රථම රාජ්‍ය නායකයා වූයේ ද අගමැති නරේන්ද්‍ර මෝදි මහතායි. අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාගේ මෙම ඉන්දීය සංචාරය ඉදිරි වසර 05 සඳහා අවශ්‍ය සැලසුම් සැකසීමට ඉතා හොඳ අවස්ථාවක් සළසා දී ඇතැයි එහිදී ඉන්දීය විදේශ කටයුතු අමාත්‍යවරයා, අග්‍රාමාත්‍යවරයා සමඟ වැඩිදුරටත් පැවසීය.

ඉන්දීය නිල සංචාරයේ දී නවදිල්ලි නුවර රාජ් ගාට් හී පිහිටි මහත්මා ගාන්ධී ස්මාරකයට ගොස් පුෂ්පෝපහාර දැක්වීමට අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා කටයුතු කළේ ය.එහිදී අග්‍රාමාත්‍යවරයා විනාඩියක නිශ්ශබ්දතාවයක්ද දක්වා ඉන් අනතුරුව අග්‍රාමාත්‍යවරයා විසින් ස්මාරක සටහන් පොතේ සමරු සටහනක් ද තබන ලදී.

ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා සිදු කළ ඉන්දීය නිල සංචාරය සම්බන්ධව ඉන්දීය මාධ්‍ය විසින් ඉහළ ප්‍රචාරයක් ලබා දී තිබේ. විශේෂයෙන් සංචාරය අතර තුර වූ සුවිශේෂී හමුවීම් පිළිබඳව ඉන්දීය අග්‍රාමාත්‍යවරයා සිය නිල ට්විටර් පිටුව ඔස්සේ ද සුවිශේෂී ප්‍රචාරයක් ලබාදීමට කටයුතු කර තිබේ.ශ්‍රී ලංකා අගමැතිවරයාගේ ඉන්දීය සංචාරය ගැන ඉන්දීය අගමැතිවරයාගේ නිල ට්විටර් අඩවියෙන් ඉහළ ප්‍රචාරයක් මෙන්ම නිල සංචාරය සම්බන්ධව ඉන්දීය මාධ්‍ය විසින් ඉහළ ප්‍රචාරයක් ලබා දී තිබේ. විශේෂයෙන් සංචාරය අතර තුර වූ සුවිශේෂී හමුවීම් පිළිබඳව ඉන්දීය අග්‍රාමාත්‍යවරයා සිය නිල ට්විටර් පිටුව ඔස්සේ ද සුවිශේෂී ප්‍රචාරයක් ලබාදීමට කටයුතු කර තිබේ.

අද (09) දිනයේ දී අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා වාරානසී (Varanasi) සහ සාරානාත් (Saranath) ප්‍රදේශවල සිද්ධස්ථාන වැඳපුදා ගැනීමටත් සාරානාත් හි සාරානාත් කෞතුකාගාරය සහ ඉසිපතන මිගදාය පුරාවිද්‍යා භූමියේ සංචාරයක ද නිරත වීමට නියමිතයි.

මෙම සංචාරය සඳහා ප්‍රජා සවිබල ගැන්වීම් සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍ය ආරුමුගන් තොන්ඩමන්, ධීවර හා ජලජ සම්පත් අමාත්‍ය ඩග්ලස් දේවානන්දා , අග්‍රාමාත්‍ය ජ්‍යෙෂ්ඨ උපදේශක හිටපු අමාත්‍ය මහාචාර්ය ජී. එල්. පීරිස්, ජනාධිපති ලේකම් පී. බී. ජයසුන්දර, අග්‍රාමාත්‍ය ලේකම් ගාමිණී සෙනරත්, මුදල් අමාත්‍යාංශ ලේකම් එස්.ආර්. ආටිගල, විදේශ සබඳතා අමාත්‍යාංශ ලේකම් රවිනාත් ආරියසිංහ, යන පිරිස ද සහභාගී වී සිටිති.

නිල සංචාරය නිමවා ලබන 11වනදා අග්‍රාමාත්‍යතුමා දිවයිනට පැමිණීමට නියමිතයි.

නාලක කලුවැව
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්